# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023**
**2025 අගෝස්තු /සැප්තැම්බර්**

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල (නව නිර්දේශය)**

**නූතන සිංහල සාහිත්‍ය ප්‍රවේශය- SINH 18214**

පළමුවන කොටසේ ප්‍රශ්නයත් දෙවන හා තුන්වන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. පහත සඳහන් පද්‍ය නිර්මාණය පිළිබඳ විචාරයක් සපයන්න.

තෙමා වැටේ මගෙ සළු පිළි නෙත් පුර     වා
අමා රසක් වැනි හිමි සඳ සිහි වෙන     වා
දමා කුමරු වැඩියා මට සිහි වෙන     වා
මෙමා ඇර ලියෝ ලෙව් තුළ ඇද්ද ත     වා

උන්නෙමු අපි ඉපිද ලෙහෙනුන් කුලේ     එදා
වැටුනේ ජලය මැද සමුදුරයේ බි     ලිඳා
දැනුනේ කරපු වීරිය ගොඩ ගන්ඩ     එදා
හිමි රජුනේ මග හැරියේ මන්ද     මෙදා

රුව ඇති පුතුන් වැදුවා මම වැරදී     ද
රුව ගුණ තේජසක් මගෙ අඩු වුණාව     ද
ගරු සරු නැතිකමක් මාතින් යෙදුණා     ද
මරු බිඳ බුදු වෙන්ට සිතෙන් පෙනුණා     ද

සුවඳ බොජුන් වැළඳූ මගෙ හිමිසඳ     ට
නිබඳ බොජුන් රසකර දුන් වළදන්     ට
සුවඳ පලා පල වැවියන් හිමියන්     ට
සුවඳ මල් නිතර පිපියන් රන්කඳ     ට

කාරණාව බුදුවෙනවා ලකුණු දැ     නේ
නැර කැටුව ආවා මම සරණ ගෙ     නේ
බාවනාව තොර නොකරමි සිතින් අ     නේ
මාලිගාව අද අඳුරුයි ස්වාමි     නේ

හිමයේ ගොසින් මල් යහනක සිටින     වද
කොමල අනගි සිරිපා දෙක රිදෙන     වද
හිගේ නැතුව දෙවියෝ මුර කරන     වද
මගෙ ඇත් රජුනි හිමි අද කොතන     කද

කැලේ තිබෙන කොයි දේවත් රස     වේවා
මලේ බඹරු මෙන් පිරිවර ඇති     වේවා
අව්වේ තියෙන රැස් මාලා අඩු     වේවා
ගව්වෙන් ගව්ව දිව මාලිග සෑ     දේවා

## II කොටස

02. ''යථාර්ථ නිරූපණය නවකතා කලාවේ මුඛ්‍ය ලක්ෂණයයි.'' සනිදර්ශන ව විභාග කරන්න.

03. ''චරිත තුනක් නවකතාවේ සාර්ථකත්වයට තුඩු දී ඇත්තේ ගැමි ජන ජීවිතය පිළිබඳ රචකයා සතු සූක්ෂ්මාවබෝධයයි.'' මෙහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

04. ''කෙටිකතාව අරභයා නිර්දේශිත අර්ථනිරූපණ විභාගයේ දී තහවුරු වන්නේ එය අනන්‍ය ලක්ෂණවලින් හෙබි ස්වාධීන සාහිත්‍යාංගයක් බවයි.'' තත් ප්‍රකාශයෙහි නිරවද්‍යතාව සසාධකව විමර්ශනය කරන්න.

05. පහත සඳහන් කෙටිකතා අතුරින් එකක් පිළිබඳව විචාරයක් සපයන්න.

1. වහල්ලු
2. තාත්තා
3. මැයි දිනය
4. කරත්තය
5. යකඩ ගැහැණිය

## III කොටස

06. කාව්‍ය නිර්මාණයක අන්තර්ගත මුඛ්‍යලක්ෂණ නිදර්ශනාශ්‍රයෙන් සමාලෝචනය කරන්න.

07. 1970 වර්ෂයෙන් ඇරඹෙන දශකයෙහි රචිත සිංහල කාව්‍ය නිර්මාණවල නිරීක්ෂණය කළ හැකි වස්තුවිෂයක විවිධතා කවරේදැයි විභාග කරන්න.

08. නාට්‍ය රසය ජනනයෙහි ලා නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරය කෙතෙක් දුරට ඉවහල් වේද යන්න පැහැදිලි කරන්න.

09. මනමේ නාට්‍යයෙහි විශිෂ්ටත්වය සඳහා හේතු වූ කාරණා පිළිබඳ සමාලෝචනයක් කරන්න.

(සෑම පිළිතුරකටම ලකුණු 20 බැගිනි)

*****************************